# ශ්‍රී ලංකාවේ සහල් මිල පාලනය අර්ථවත් ද ?

ඕ. ජී. දයාරත්න බණ්ඩා, ජේ. එම්. ඒ. ජයවික්‍රම, එම්. වී. රණතිලක ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන විද්‍යා අංශය පේරාදෙණිය විශ්ව විද්‍යාලය



## 1. හැඳින්වීම

මෑතක දී සිදු වූ සහල් මිල ඉහළ යාමත් එයට සම්බන්ධ රාජ්‍ය ප්‍රතිචාරයනුත් මෙම සන්නිවේශන සටහනෙන් විශ්ලේෂණය කෙරෙයි. මෙහි දී අවධානය යොමු කෙරෙන්නේ පහත දැක්වෙන කරුණු කෙරෙහි ය.

- මෑත දී සිදු වූ සහල් මිල ඉහළ යාම දිගට ම පවතින්නක් ද? නැති නම් තාවකාලික සංසිද්ධියක් ද?
- 2008 ජනවාරි මාසයේ සිට සහල් මිල අසාමාන්‍ය ලෙස ඉහළ ගොස් ඇත්තේ ඇයි?
- සහල් අර්බුදය වෙළෙඳපොළ හේතු නිසා ඇති වූවක් ද? නැතිනම් රාජ්‍ය ප්‍රතිපත්තීන් හි ප්‍රතිඵලයක් ද?
- සහල් මිල පාලනයෙහි ආර්ථිකමය ප්‍රතිඵල කෙසේ වේ ද?
- රජයේ සැලකිල්ලට භාජන විය යුතු වෙනත් ප්‍රතිපත්තිමය විකල්පයන් තිබේ ද?

## 2. සහල් මිලෙහි මෑතකාලීන ප්‍රවනතා

ශ්‍රී ලංකාවෙහි සහල් මිල 2008 ජනවාරි මාසයේ දී ශීඝ්‍ර ලෙස ඉහළ ගිය අතර එම ප්‍රවනතාව ආරම්භ වූයේ 2007 වර්ෂයේ මැද භාගයේ දී ය.



ඉහළ යන සහල් මිල : 2007 දෙසැම්බරයේ දී රුපියල් 46 ක් වූ සහල් කිලෝව 78% කින් ඉහළ යමින් 2008 ජනවාරියේ දී රුපියල් 82 ක් දක්වා නැංගේ ය. 2007 අවුරුද්ද මුල දී සම්බා සහල් කිලෝවක මිල වූයේ රුපියල් 44 කි. 2007 දෙසැම්බරයේ දී රු.40 ක් වූ කැකුළු සහල් කිලෝව 67.5% කින් ඉහළ යමින් 2008 ජනවාරියේ දී රු. 67 ක් බවට පත් වූයේ ය. 2007 ජනවාරියේ දී කැකුළු සහල් කිලෝවක මිල වූයේ රු.36 කි. එසේ ම 2007 දෙසැම්බරයේ දී රු.40 කට ආසන්න මිලක පැවැති නාඩු සහල් කිලෝව ද 67% කින් ඉහළ යමින් 2008 ජනවාරියේ දී රු.67 ක් බවට පත් වී ය. 2007 අවුරුද්ද මුල දී නාඩු සහල් කිලෝවක මිල පැවැතිසේ රු. 35 ක් ආසන්නයේ ය.

පසුගිය දශක කීපය ඇතුළත දී මේ සා විශාල සහල් මිල ඉහළ නැඟීමක් ශ්‍රී ලංකාවෙහි සිදු වී නැත. 2008 න් ඉහත අවුරුදුවල දී සහල් මිලෙහි උච්චාවචනයන් සිදු වූයේ එක්තරා සුපුරුදු රටාවකට අනුව ය. චක්‍රීය ස්වභාවයක් ගත් එකී සහල් මිල උච්චාවචන රටාවෙහි ස්වභාවය වූයේ අවුරුද්දේ ඒ ඒ කාල වකවානුවල දී මිලෙහි වෙනස් වීම් ඇති වීමයි. එක් එක් වර්ගවල සහල් ඒවාට ම විශේෂ වූ මිල ගණන්වලින් අවුරුද්දේ ඒ ඒ කාල වකවානුවල දී වෙනස් වූ අතර සෑම අවුරුද්දක දී ම එය සිදු වූයේ එක ම ආකාරයකිනි.

එකී සමයෙහි දී සෑම අවුරුද්දක ම සැප්තැම්බර් මාසයේ දී ඉහළ නඟින්නට පටන් ගන්නා සහල් මිල ජනවාරි මාසය වන විට උපරිමය දක්වා ගොස් යළි පහළ බැස්සේ ය. එකල සහල් මිල නැඟීම ආරම්භ වන්නේ යල් කන්නය අවසාන වන විට ය. යල් කන්නයේ නිෂ්පාදනය සාමාන්‍යයෙන් පහළ තත්ත්වයක පවතින හෙයින් සහල් මිල පහළ බසින්නේ මඳ වශයෙන් වන අතර එම තත්ත්වය ද පවතින්නේ කෙටි කාලයකි.

ඉදිරියේ දී සැපයුම අඩු වන බව වෙළෙඳපොළට දැනෙන විට මිල ඉහළ නඟින්නට පටන් ගනී. දේශීය සැපයුම අඩු වන .මෙම කාලයේ දී ඇති වන සහල් ඉල්ලුම සුමට කරවීම පිණිස කළයුතු වන්නේ නිසි ආනයන ප්‍රතිපත්තීන් අනුගමනය කිරීම ය.

## 3. සහල් අර්බුදයෙහි සුලමුල. සහල් ඌනතාවක් හෝ හිඟයක් සැබැවින් ම තිබිණි ද? එසේ නම් ඊට හේතු කවරේ ද?

රජයේ ප්‍රකාශ කරන පරිදි සහල් මිල ඉහළ යාමෙහි එක් හේතුවක් වන්නේ පසු ගිය මහ කන්නයේ අස්වනු නෙලන කාලයේ දී ඇති වූ ජල ගැලීම් ය. කෙසේ වුව ද අප ගේ පර්යේෂණයන් ගෙන් පෙනී ගොස් ඇත්තේ 2008 දී සිදු වූ මිල ඉහළ යාම හිටි හැටියේ සිදු වූවක් නොවන අතර එම ප්‍රවනතාව 2007 මැද භාගයේ සිට දක්නට ලැබුණු බව ය.

විවිධ හේතූන් හි ප්‍රතිඵලයක් වශයෙන් 2008 වර්ෂය ඇතුළත දී සහල් මිල 3.9% කින් පමණ අඩු වීමට ඉඩ තිබෙන බව ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහස වී තිබිණි. (ශ්‍රීලමබැ 2007), 2006 වර්ෂයේ සමස්ත නිමැවුමට සාපේක්ෂව 2007 දී වී නිෂ්පාදනය පහත වැටෙනු ඇත්තේ 6.4% කින් පමණකැයි සමස්ත වාර්ෂික නිෂ්පාදන සංඛ්‍යාරූපයන් ඔස්සේ බලන කෙනෙකුට සිතෙන්නට පුළුවන. ඉහත වර්ෂයේ සංඛ්‍යාරූපයන්ට සාපේක්ෂව 2007 දී ඒක පුද්ගල වී නිෂ්පාදනය 7% කින් පහත වැටිණි. එසේ වුව ද වී නිෂපාදනයෙහි මෙම පහත වැටීම මෑත කාලීන සහල් මිල ඉහළ යාම විෂයෙහි දැඩි බලපෑමක් ඇති කරන්නට ඇතැයි සිතිය නොහැකි ය. 2000 වර්ෂයේ සිට ම ශ්‍රී ලංකාවේ වී නිෂපාදනයෙහි බරපතල උච්චාවචනයන් ඇති වූයේ ය. ඇතැම් අවුරුදුවල දී අති විශාල ඉහළ නැඟීම් මෙන් ම තවත් ඇතැම් අවුරුදුවල දී අති විශාල පහත බැසීම් ද දක්නට ලැබිණි. කරුණු කෙසේ වුව ද වර්තමානයේ දී පවතින තරම් සුවිශාල සහල් මිල නැඟීමකට ශ්‍රී ලංකාව අතීතයේ දී කිසි විටෙක මුහුණ දී නැත. සහල් නිෂ්පාදනයේ උච්චාවචනයන් ඇති වන අවස්ථාවන් හි දී ජනතාව ආනයනිත සහල් හෝ තිරිඟු පිටි භාවිතයට යොමු වූවා විය හැකි ය.

රට තුළ පවතින සමස්ත සහල් ප්‍රමාණයෙහි දේශීය නිෂපාදිතයන් මෙන් ම ආනයනිත තොග ද අඩංගු ය. 2000-2008 අතරතුර කාලයේ දී පැවැති ඒකපුද්ගල සහල් ප්‍රමාණය කිලෝග්‍රෑම් 106 ක් වූ අතර ඒකපුද්ගල පරිභෝජනය කිලෝග්‍රෑම් 102 ක් වූයේ ය.

2008 ජනවාරි මාසයට පෙර, දේශීය නිෂපාදිතයත් ආනයනිත සහල් ප්‍රමාණයත් රටෙහි සහල් ඉල්ලුම සපුරා ලීමට ප්‍රමාණවත් වූයේ ය. එහෙත් සහල් සහ තිරිඟු ආනයනයන් මත රජය විවිධ සීමාවන් පැනවීමත් සමග සහල් හිඟයක් නිර්මාණය විණි.

### සහල් සහ අතරමැදියෝ

වී සහ සහල් වෙළෙඳපොළ තුළ පවතින උපරිම ලාභ සෙවීමේ චර්යාව ( වී හෝ සහල් තොග සඟවා තැබීම ) කිසියම් ප්‍රමාණයකට සහල් මිල ඉහළ යාම කෙරෙහි හේතු වී ඇතත්, අපතයන් සහ බර අඩු වීම් අනුව ගබඩා කිරීමේ පිරිවැය සැලකීමේ දී දිගු කලක් තොග රැස් කර තබාගැනීම ආර්ථික වශයෙන් ශක්‍යතා සහිත වන්නක් නොවන හෙයින් එහි බලපෑම දිගු කල් පවතින්නක් නොවන්නේ ය. එසේ ම තොග රැස් කරන්නෝ සාමාන්‍ය තත්ත්වය ඉක්මවා මිල ඉහළ යන විට තම සහල් තොග විකුණති. ලාභාපේක්ෂාවෙන් යුතුව තොග රැස් කිරීමේ පුරුද්ද 1970 හි පසු භාගයේ දී මිල පාලනය ඉවත් කරනු ලැබීමෙන් අනතුරුව සහල් වෙළෙඳ පොළ තුළ දක්නට ලැබිණි. වී සහ සහල් මිල ඉදිරියේ දී වැඩි වෙතැයි නිෂ්පාදකයනට (නැතහොත් අතරමැදියනට) දැනුනහොත් ඔවුන් කරන්නේ තොග රඳවාගැනීම ය. තාවකාලික හිඟයන් නිර්මාණය වීමට මෙම තත්ත්වය හේතු වන්නේ ය.

ඉහත කී ආකාරයේ ලාභ සොයන්නෝ පසුගිය මාස පහ තුළ වෙනස් ආකාරයකින් හැසිරෙන්නට ඇතැයි සිතීමට සුවිශේෂ හේතු නැත.

අනාගත මිල වැඩි වීම් අපේක්ෂාවෙන් සහල් තොග රැස් කිරීම නිසා මිල ඉහළ යාමේ ප්‍රවනතා ඇති විය හැකි ය.

කෙසේ වුව ද මෙහි සැබෑ තත්ත්වය වන්නේ රජය විසින් මිල පාලනය ක්‍රියාත්මක කැරුණු අවස්ථාව දක්වා ම සහල් මිල අධික වේගයකින් ඉහළ ගිය බවයි. නිෂ්පාදකයන් ළඟ හෝ අතරමැදියන් ළඟ රැස්කරගත් තොග තිබුණේ නම් මිල උපරිමයට නැගුණු අවස්ථාවෙහි දී ඔවුන් ඒවා විකුණා තිබිය යුතු ය. සහල් මිල වෙළෙඳපොළෙහි උපරිම තලයේ පවතින විට නිෂ්පාදකයන් සහ අතරමැදියන් ඒවා නොවිකුණා තබාගන්නට ඇතැයි සිතීම මුළාවකි.

සංවාද
SANVADA
சம்வாதம்

pathfinder Foundation

'POLICY BRIEF 10'

නිසි අවස්ථාවෙහි දී ප්‍රමාණවත් සහල් තොග ආනයනය නො කිරීම තුළින් කෘත්‍රිම සැපයුම් හිඟයක් මැවීමත් මිල වැඩි වීමට තුඩු දෙන්නා වූ කූටෝපක්‍රම යෙදීමත් වැනි තරඟකාරිත්ව විරෝධී පියවරයන් ද ක්‍රියාත්මක වේ. සහල් ආනයනකයන් හා දේශීය සහල් වෙළෙන්දන් සහයෝගීව එබඳු කූටෝපක්‍රම යොදන අවස්ථා ද තිබිය හැකි ය. සහල් හිඟයක් මවමින් ගනු ලබන තරඟකාරිත්ව විරෝධී පියවරයන් මිල පාලනයන් ක්‍රියාවට නැංවීම තුළින් නවතාලිය නොහැකි ය. එය නවතාලිය හැකි වන්නේ වී සහ සහල් වෙළෙඳපොළවල තරඟකාරිත්ව විරෝධී ක්‍රියාවන් වළකාලන නීති ක්‍රියාවට නැංවීම තුළින් ය.

## සහල් සහ තිරිඟු ආනයන ප්‍රතිපත්තියෙහි බලපෑම

2006 දී ක්‍රියාවට නංවන ලද ඉහළ ආනයන බදු හේතු කොටගෙන ශ්‍රී ලංකාව විසින් ඉල්ලුමට සරිලන සහල් ප්‍රමාණයන් ආනයනය නො කරන ලදී.

2002 වන තෙක් සහල් ආනයනය කරන ලද්දේ සියයට 35 ක තීරු බද්දකට යටත්ව ය. කලින් කලට සැපයුම් හිඟයන් ඇති වන අවස්ථාවන් හි දී 2002 වන තෙක් වරින් වර මෙම තීරු බද්ද ඉවත් කිරීමට රජය පියවර ගත්තේ ය. 2005 ට පෙර දී මෙම ප්‍රතිපත්තිය සැපයුම් හිඟයන් පවතින අවස්ථාවන් හි දී මැනවින් ක්‍රියාත්මක වූයේ ය. ටොන් එකකට රුපියල් 7,000 බැගින් වූ සමතොග තීරු බදු 2002 දී ඒ වෙනුවට ක්‍රියාත්මක කරන ලද අතර 2005 දී එය රුපියල් 9,000 දක්වා වැඩි කරන ලදී. එහෙත් 2005 දී දේශීය කර්මාන්ත ආරක්ෂණ ප්‍රතිපත්තිය යළි ක්‍රියාත්මක වීමෙන් පසු 2006 දී සහල් තීරු බද්ද ටොන් එකකට රුපියල් 20,000 ක් වන සේ රජය විසින් යළි වැඩි කරන ලදී. රෆීක් සහ සමරතුංග (2000) පවසන්නේ මෙම කලාපයේ වෙනත් ඇතැම් රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාවෙහි සහල් ආනයනයන් හා අදාළ වෙළෙඳ සීමා කිරීම් ඉහළ ම තත්ත්වයක පවතින බව ය.

තාවකාලික සහල් හිඟයන් මෙන් ම මිල ඉහළයාම් ද දැඩි වීමට වෙළෙඳ සීමා කිරීම් හේතු වී තිබේ. 2006 න් පසුව සහල් හිඟයන් ඇති වන වකවානුවල දී තීරු බදු ඉවත් කිරීම් ක්‍රියාත්මක කිරීමට ද රජය පියවර ගෙන නැත. මෑත දී ඇති වුණු සහල් අර්බුදයට ප්‍රධාන වශයෙන් ම බලපෑවේ සහල් ආනයන ප්‍රතිපත්තියෙහි දුර්වලතාවයි.

තිරිඟු වූ කලී දේශීය සහල් සඳහා ඇති ප්‍රබල ආදේශකයක් බව දත්ත අනුව පැහැදිලි වේ. මිල ඉහළ යාම නිසා සහල් සඳහා අමතර ඉල්ලුමක් නිර්මාණය වූ විට දේශීය සහල් මිල ද ඉහළ යන්නේ ය. 2005 වර්ෂයේ දී තිරිඟු මෙට්‍රික් ටොන් 790,000 ක් පමණ ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබී ය. 2005 දී මෙට්‍රික් ටොන් 2,164,000 ක් වූ සහල් නිෂ්පාදනය 2006 දී මෙට්‍රික් ටොන් 2,228,000 ක් දක්වා ඉහළ ගිය නමුදු තිරිඟු ද මෙට්‍රික් ටොන් 1,239,000 ක් එම වර්ෂයේ දී ආනයනය කරනු ලැබ තිබේ. කෙසේ වුවද 2007 දී තිරිඟු ආනයනය මෙට්‍රික් ටොන් 952,000 දක්වා සීඝ්‍ර ලෙස පහත බැස්සේ ය. තිරිඟු ආනයනය කෙරෙහි බලපාන වෙළෙඳ සීමා කිරීම් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක ය.

තිරිඟු ආනයන තීරු බදු : 2006 වර්ෂයෙන් පසුව 15% ක තිරිඟු ආනයන බද්දක්, 10% ක ආනයන අධිභාරයට ද 3% ක වරාය සහ ගුවන්තොට සංවර්ධන ගාස්තුවට ද එසේ ම 1.5% ක සමාජ වගකීම් ගාස්තුවට ද අමතරව අය කරන ලදී. 2007 දී තිරිඟු පිටි සහනාධාරය ද රජය විසින් නවතා දමන ලදී.

සහල් සහ වෙනත් ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය වැඩි කිරීමකින් තොරව තිරිඟු ආනයනයට දැඩි සීමාවන් පැනවීම නිසා සහල් මත පරිභෝජන පීඩනයක් නිර්මාණය වී ඇත. තිරිඟු සහ සහල් සම්බන්ධයෙන් රජය අනුගමනය කරන සීමාකාරී ආනයන ප්‍රතිපත්තිය ශ්‍රී ලංකාවෙහි මෑතකාලීනව සිදු වූ සහල් මිල ඉහළ යාම කෙරෙහි බරපතල ලෙස බලපා ඇති බව ඉහත දැක්වුණු කරුණු අනුව පෙනේ. පහත බැස ඇති වී නිෂ්පාදනය (2006 වර්ෂයේ වී නිෂ්පාදනයට සාපේක්ෂව) ද තිරිඟු ආනයනය අඩු කිරීම ද සහල් මත අධිකතර ඉල්ලුමක් ඇති වීමට හේතු වී තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස ඇති වුණු සහල් පරිභෝජනයෙහි ඉහළ යාම ඉල්ලුමෙහි ඉහළ යාම කෙරෙහි බලපාන්නට ඇත.

වෙනත් රටවල ආනයන බාධාවන් ඉවත් කිරීම : තිරිඟු පිටි මත පනවනු ලැබ තිබුණු 36% ක ආනයන තීරු බද්ද ඉන්දියාව ඉවත් කෙළේ ය. තිරිඟු සහ සෝයා මත පනවනු ලැබ තිබුණු තීරු බදු ඉන්දුනීසියාව ඉවත් කෙළේ ය. තිරිඟු සහ ඉරිඟු මත වූ තීරු බදු ඉවත් කිරීමට පේරු රාජ්‍යය ද පියවර ගත්තේ ය. තිරිඟු මත වූ ආනයන බදු 130% සිට 8% දක්වා ද බාර්ලි මත වූ ආනයන බදු 100% සිට 0% දක්වා ද අඩු කිරීමට තුර්කිය ද තීරණය කෙළේ ය.ආනයනිත තිරිඟු සහ පිටි මත අය කළ ආකලිත වටිනාකම් බද්ද ඉවත් කිරීමට මොංගෝලියාව ද ක්‍රියා කෙළේ ය. එහෙත් ශ්‍රී ලංකාව තවමත් ඉහළ අනුපාතයකින් තිරිඟු මත තීරු බදු අය කරයි. (http://business.com.au/)

## 4.මිල පාලනයෙහි ආර්ථික විපාක-ක්‍රියාවට නැංවීමෙහි ගැටලු

ස්වකීය පිරිවැයත් සාධාරණ ලාභ තීරුවත් ඉක්මවන මිලක් ලබාගනිමින් පරිභෝජකයන් ගසා කෑමට තරඟකාරී වෙළෙඳපොළක් තුළ දී ඉඩ නො ලැබෙන්නේ ය. එසේ ම සහල් ලබා ගැනීමේ හැකියාව ද වැඩි ම අවශ්‍යතාවක් ඇති පරිභෝජකයනට ලැබෙන්නේ ය. එහෙත් මිල පාලනයකින් සිදු වන්නේ මෙම යාන්ත්‍රණය දුර්වල වී යාමයි.

මිල පාලනය ක්‍රියාවට නැඟීම සඳහා රාජ්‍ය අරමුදල් හා මානව සම්පත් සැලකිය යුතු ප්‍රමාණයක් ද එසේ ම පැහැදිලි යාන්ත්‍රණයක් ද අවශ්‍ය වන්නේ ය. මිල පාලනයට අනුව වෙළෙන්දන් කටයුතු කරන්නේ ද යන්න සොයා බැලීම පිණිස අධීක්ෂණ යාන්ත්‍රණයක් ද රට තුළ ක්‍රියාත්මක කළ යුතුව තිබේ. එපමණක් නොව, පරිභෝජකයන් සහ වෙළෙන්දන් වෙතින් එන පැමිණිලි පිළිබඳව සොයා බලා පිළියම් යෙදීම සඳහා සංවිධානයක් ද අවශ්‍ය වනු ඇත. මෙම කටයුතු හේතු කොටගෙන රජය මත විශාල බරක් පැටවෙනවා පමණක් නොව, ශ්‍රී ලංකාවෙහි සහල් වෙළෙඳපොළ අකාර්යක්ෂම වී යාම ද එහි දී සිදු වනු ඇත.

## සමාජ ශුභසාධනය විෂයෙහි ඇති වන බලපෑම


මිල පාලනයත් සමඟ සමාජ ශුභ සාධන පියවරයන් අඩු වී යාමෙහි ප්‍රවනතාවක් තිබේ. යම් යම් නියාමනමය මැදිහත් වීම් රජය පැත්තෙන් ක්‍රියාත්මක වන්නේ නම් වෙළෙඳපොළ යාන්ත්‍රණයක් ඔස්සේ සමාජ හිතකර ප්‍රතිඵල උදා කර ගත හැකි වනු ඇත.

අතරමැදියන් ගෙන් නිෂ්පාදකයන් සහ පරිභෝජකයන් ආරක්ෂා කිරීම මිල පාලනයක් තුළින් අපේක්ෂා කෙරෙතැයි ප්‍රකාශිත අරමුණ ය. ශ්‍රී ලංකාවෙහි සහල් හා සම්බන්ධ සැපයුම් හා ඉල්ලුම් නම්‍යතාවන් ස්ථාවර තත්ත්වයක පවතින හෙයින් සහල්වල වෙළෙඳපොළ මිල යටතේ නිෂ්පාදකයන් මෙන් ම පරිභෝජකයන් ද එක සේ ප්‍රතිලාභ ලබති. පාලන මිල සුපුරුදු මධ්‍යක (Average) මිලට අඩු වුවහොත් සිදු වන්නේ පරිභෝජකයාට වාසි වන නමුදු නිෂ්පාදකයාට අවාසියක් සිදු වීමයි. (එලිස් 1992).

අප ඉහත දී ද සඳහන් කළ පරිදි, සහල්වල පාලන මිල ගණන් මෑතක තිබුණු මධ්‍යක මිල ගණන්වලට වඩා වැඩි වූ බැවින් වාසියකට වඩා අවාසියක් අත් විඳීමට පරිභෝජකයනට සිදු විය හැකි ය. මෙවැනි තත්ත්වයක් යටතේ නිසි තරඟකාරිත්වයක් සහල් වෙළෙඳපොළ තුළ තිබේ නම්, මිල පාලනය හේතු කොටගෙන ඇති වන්නේ දිගු කාලීන පරිභෝජක යහපත නැති වී ගොස් නිෂ්පාදකයාට මඳ යහපතක් ඇති වීමේ ඉඩකි. එසේ වුව ද ශ්‍රී ලංකාවෙහි සහල් වෙළෙඳපොළ තුළ පවතින බොහෝ දෝෂ හේතු කොටගෙන වෙළෙඳපොළ තුළින් තීරණය වූ සාමාන්‍ය මිල ඉක්මවන පාලන මිල ගණන් ඇත්ත වශයෙන් ම වාසිදායක වන්නේ නිෂ්පාදකයනට නොව අතරමැදියනට ය.

කාර්යක්ෂමතාවෙහි බරපතල දුබලතාවන් ද මිල පාලනය නිසා ඇති විය හැකි ය. මෙකී න්‍යායාත්මක තත්ත්වයන් අනුව පෙනෙන්නේ මිල පාලනයන් ක්‍රියාත්මක කිරීම කෙසේ වුව ද ඒවා ඉවත් කරනු ලැබීම තුළින් පරිභෝජක යහපත සැලසෙන බව ය. එසේ ම පෞද්ගලික අලෙවි කිරීම් ක්‍රමයක් සඳහා යටිතල පහසුකම් සකසා දීම වැනි සහයෝගයන් ඔස්සේ රජය සුළු වශයෙන් වී වෙළෙඳපොළට මැදිහත් වන්නේ නම් වෙළෙඳපොළ මිල ගණන් ස්ථාවරව තබාගැනීමෙහි ලා මිල පාලනයන් පනවනවාට වඩා වැඩ දායක වන බව ද පැහැදිලි වන්නේ ය. මුළු නිෂ්පාදිතයෙන් සියයට 5 ක් හෝ ඊට අඩු ප්‍රමාණයක් රජය ලබාගැනීමත් දේශීය වෙළෙඳ පොළ සමබරව තබාගැනීම පිණිස ආනයනයන් යොදාගැනීමත් ඔස්සේ ඉන්දුනීසියාව අවුරුදු ගණනාවක් තිස්සේ යහපත් ප්‍රතිඵල සාක්ෂාත් කරගෙන තිබේ. (එලිස් 1992).

## තොග හිඟ වීම් සහ කළු වෙළෙඳපොළ



මිල පාලනයෙහි ප්‍රතිඵල අවබෝධ කරගැනීමට නම් නිදහස් වෙළෙඳපොළක් තුළ මිල උච්චාවචනයන් සිදු වන ආකාරය පිළිබඳ අවබෝධයක් තිබිය යුතු ය. එහි කිසිදු ගුප්ත භාවයක් නැතත් සිදු වන්නේ කුමක් ද යන්න ඉතා නිරවුල්ව දැන සිටීම අතිශයින් වැදගත් ය. මිල ඉහළ යන්නේ ප්‍රවර්තන මිල ගණන් යටතේ සැපයෙන ප්‍රමාණය ඉක්මවා ඉල්ලුමක් ඇති වන විට ය. මිල පහත වැටෙන්නේ ප්‍රවර්තන මිල ගණන් යටතේ පවතින ඉල්ලුම ඉක්මවා සැපයුමක් ඇති වන විට ය. ඉහත සඳහන් කළ තත්ත්වය භාණ්ඩ හිඟය යනුවෙන් හැඳින්වෙන අතර දෙවැන්න හැඳින්වෙන්නේ අතිරික්තය යනුවෙන් ය. මේ දෙක ම රඳා පවතින්නේ පවත්නා මිල ගණන් මත ය.

මුළුමනින් නිදහසේ ක්‍රියාත්මක වීමට වෙළෙඳපොළවලට ඉඩ හළහොත් භාණ්ඩ හිඟයන් මෙන් ම අතිරික්තයන් ද පහව ගොස් සමතුලිත මිලක් නිර්මාණය වන්නේ ය.

වෙළෙඳපොළ බලවේගයන් හේතු කොටගෙන සහල් හිඟයක් නිර්මාණය වීමට ඇති ඉඩකඩ විරල ය. ඇත්ත වශයෙන් ම සහල් හිඟයන් නිර්මාණය වන්නේ රජය විසින් පනවනු ලබන මිල පාලනයන් හේතු කොටගෙන ය.

සහල් අඩුවෙන් නිපදවෙන ප්‍රදේශ තුළ සහල් හිඟයක් නිර්මාණය විය හැකි ය. එහෙත් යම් නිෂ්පාදිතයක හිඟයක් ඇති වන්නේ පරිභෝජකයන් ගේ සබඳතාවට සාපේක්ෂව එය දුලබ වීමේ හේතුව නිසා ම නොවේ. යම් භාණ්ඩයක් අතිශයින් දුලබ නොවන අවස්ථාවක දී එහි හිඟයක් ඇති විය හැකි වන්නා සේ ම, අතිශයින් දුලබ භාණ්ඩයක් වුව ද කිසිදු හිඟයකින් තොරව ලබාගත හැකි වීමට ද ඉඩ තිබේ. මිල පාලනයන් යටතේ, ප්‍රබල ඉල්ලුමක් සහිත වෙළෙඳපොළක් වෙත භාණ්ඩ හා සම්පත් සැපයීමේ දී මිල හා සම්බන්ධ ක්‍රියාවලිය සාමාන්‍ය පරිදි සිදු වන්නේ නැත. එහෙත් පරිපාලන නියෝගයන් හි අන්තර්ගත අනුපේක්‍ෂයන් ගෙන් වෙනස් ව ඔවුනොවුනට වාසිදායක වන්නා වූ ගනුදෙනුවල යෙදීමේ ඉඩකඩ මිල පාලනයන් විසින් අවුරාලනු ලබයි. කෙසේ වුව ද අවදානමකට මුහුණ දීමට කැමැති විකුණුම්කරුවෝ සහ ගැනුම්කරුවෝ මිල පාලනයන් නොතකා ඔවුනොවුනට වාසිදායක වූ ගනුදෙනුවල යෙදෙති.

නෛතික අවදානම්වලට ද මුහුණ දීමේ වියදම් ආවරණය කරගැනීමට ද වෙළෙන්දන් යොමු වීමේ ප්‍රතිඵලයක් වශයෙන් මිල පාලනයන් විසින් නිර්මාණය

කෙරෙන කළු වෙළෙඳපොළවල පවතින මිල, බොහෝ විට රජයෙන් අනුමතව ඇති මිල පමණක් නොව, නිදහස් වෙළෙඳපොළක් තුළ ඇති වෙතැයි සිතිය හැකි මිල ද ඉක්මවන්නක් වනු ඇත.

රහසිගතව ක්‍රියාත්මක වීමට කුඩා පරිමාණයේ කළු වෙළෙඳපොළවලට හැකියාව ඇති නමුදු, නොදුටුවා සේ සිටින නිලධරයන් සතුටු කරවීමේ පිරිවැය ද මහ පරිමාණ කළු වෙළෙඳපොළවල් විසින් උපයාගත යුතු ය. අප වැනි දුබල ප්‍රජාතන්ත්‍රවාදයක් පවතින රටක දී රාජ්‍ය නිලධරයන් මෙන් ම දේශපාලකයන් ද යහපත් ලෙස කටයුතු කරතැයි සිතිය නොහැකි ය. ඔවුන් ගාස්තු ඉල්ලා සිටීමට ඇති ඉඩකඩ බොහෝ ය.

අතරමැදියෝ රාජ්‍ය නිලධරයන් සහ දේශපාලකයන් සමඟ එකතුව ඔවුනොවුනට වාසිදායක වන ආකාරයේ මිල පාලනයන් පනවාගැනීමේ ක්‍රම ද ක්‍රියාත්මක නොවෙතැයි කිව නොහැකි ය.

## ගුණාත්වය හීන වීම

මිල පාලනයක් ක්‍රියාත්මක වන විට රාජ්‍ය නියෝගයන් මඟින් කෘත්‍රිම ලෙස මිල පහළ මට්ටමක පවත්වාගෙන යාමට උත්සාහ දැරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ගුණාත්වය හීන වීම, බොහෝ වෙනත් භාණ්ඩ හා සේවාවන් සම්බන්ධයෙන් ද පොදු තත්ත්වයකි. මිල පාලනයෙහි දී මතු වන ප්‍රධාන ගැටලුවක් නම් පාලනය කෙරෙන්නේ කාගේ මිල ද යන්න නිරාකරණය කරගැනීමේ අපහසුවය.

මිල තීරණය කිරීමෙහි දී සහල් හා සම්බන්ධ පූර්ව නිශ්චිත ප්‍රමිතියක් ගැන සඳහන් වන්නේ නැත. මිල පාලනය පනවනු ලැබ තිබෙන්නේ සම්බා, කැකුළු සහ නාඩු යන සහල් වර්ග තුන මත ය. එහෙත් රජය එම සහල් වර්ග තුන මත මිල ගණන් තුනක් පමණක් නියම කරනු ලැබ තිබෙන්නේ වෙළෙඳපොළෙහි තිබෙන විවිධ ප්‍රමිතීන් හි සම්බා, කැකුළු (රතු) සහ නාඩු සහල් පිළිබඳ සැලකීමකින් තොරව ය. හිඟයක් පවතින අවස්ථාවක දී ඕනෑ ම සහල් වර්ගයක් පාලන මිලට විකිණෙන බැවින් ඉහළ ප්‍රමිතියක් පවත්වාගෙන යාම සඳහා දිරි ගැන්වෙන ක්‍රියා මාර්ගයක් ද පෙනෙන්නට නැත.

සහල්වල ගුණාත්වය පවත්වාගැනීම හෝ වැඩි දියුණු කිරීම හෝ පිණිස කිසිදු දිරිගැන්වීම් ක්‍රමයක් මිල පාලන වැඩ පිළිවෙළක් යටතේ ක්‍රියාත්මක නොවේ. අවසාන ප්‍රතිඵලය වන්නේ සාමාන්‍ය ප්‍රමාණය ද ඉක්මවන මිලක් ගෙවා බාල සහල් ලබාගැනීමට පරිභෝජකයනට සිදු වීම ය.

## ප්‍රතිපත්තිමය නිර්දේශ

මෑතක දී සිදු වූ සහල් මිල ශීඝ්‍ර ලෙස ඉහළ යාම දිගට ම පවත්නා තත්ත්වයක් නොව තාවකාලික සංසිද්ධියකි. එකී මිල නැගීමට බල පෑ සාධක කීපයක් අප විසින් හඳුනාගනු ලැබ තිබේ.

- ප්‍රධාන වශයෙන් ම දෝෂ සහගත ආනයන ප්‍රතිපත්තියෙහි ප්‍රතිඵලයක් වශයෙන්, ප්‍රමාණවත් සහල් තොග අනයනය කරවාගෙන තාවකාලික සහල් හිඟය පිරිමසාගැනීමට අසමත් වීම මූලික ම කරුණයි. සහල් ආනයනය කරමින් අනාගත වෙළෙඳපොළ අවශ්‍යතාවන් සඳහා ප්‍රතිචාර දැක්වීමට පෞද්ගලික අංශය අසමත් වී ඇති අතර 2006 වර්ෂයේ දී පැනවුණු විශාල තීරු බදු ද සහල් ආනයනය විෂයෙහි බරපතල බාධාවක් වී තිබිණි. තිරිඟු මත පැනැවුණු ආනයන බදු ඉහළ නැංවීම ද සහල් අර්බුදය තවත් උග්‍ර කෙළේ ය. රජයේ දේශීය කර්මාන්ත ආරක්ෂා කිරීමේ ප්‍රතිපත්තිය ද යම් ප්‍රමාණයකින් මෙම තත්ත්වයට දායක වන්නට ඇත.
- තිරිඟු පිටි පරිභෝජනය අඩු කිරීම විෂයෙහි රජයෙන් කරන ලද පෙළඹවීම හේතු කොටගෙන සහල් පරිභෝජනය ඉහළ යාම දෙවැන්නයි. තිරිඟු සහනාධාරය ඉවත් කිරීම සාධාරණ පියවරක් වුව ද තිරිඟු ආනයනය මත විශාල බදු පැනැවීම සාධරණ යයි පිළිගත නොහැකි ය.
- දේශීය මෙන් ම ආනයනිත යන සහල් වෙළෙඳපොළවල් දෙකෙහි ම පොදු ලක්ෂණයක් වශයෙන් තරගකාරිත්ව විරෝධී කටයුතු සිදු වීම තුන් වැනි සාධකයයි. මෙම ක්‍රියාවන් විසින් කෘත්‍රිම හිඟයන් නිර්මාණය කරන ලද අතර සහල් මිල ද ඉහළ නංවන ලදී. අවසාන වශයෙන් ජල ගැලීම් වැනි වෙනත් හේතූන් ද කිසියම් ප්‍රමාණයකින් සහල් මිල ඉහළ යාම කෙරෙහි බලපාන්නට ඇත.



එබැවින් අපගේ මතය වන්නේ මිල පාලනයක් මඟින් ශ්‍රී ලංකාවෙහි සහල් අර්බුදයට දැනෙන විසඳුමක් ලබා දිය නොහැකි වන බවයි. මෙම අර්බුදය විසඳාලීමෙහි ලා වැඩදායක වෙතැයි සිතිය හැකි ප්‍රතිපත්තිමය නිර්දේශයන් කීපයක් ඉදිරිපත් කිරීමට මෙහි ලා අපි උත්සාහ දරමු.

### කෙටි කාලීනව :

- මිල පාලනයන් පැනවීමෙහි නොයෙදී සහල් සහ තිරිඟු ( සහල් හා ආසන්නතම ආදේශකය ) ආනයනය කරමින් තාවකාලික සහල් හිඟය දුරලීමට පියවර ගත යුතු ය. සහල් ආනයනය විෂයෙහි බලපාන්නා වූ ප්‍රවර්තන වෙළෙඳ බාධකයන් අර්ථවත් ලෙස අඩු කරලීමට පියවර ගත යුතු ය.

### මධ්‍යම කාලීනව :

- තරඟකාරිත්ව නීති ක්‍රියාවට නැංවීම තුළින් වෙළෙඳපොළ අක්‍රමිකතාවන් ඉවත් කිරීමට රජය පියවර ගත යුතු ය. දේශීය මෙන් ම ආනයනිත සහල් වෙළෙඳපොළෙහි ද පවත්නා තරඟකාරිත්ව විරෝධී කටයුතු නතර කරවීම සඳහා තරඟකාරිත්ව නීතීන් ක්‍රියාත්මක කළ යුතු ය. එළිපිට ම සංවිධානය වෙමින් ඉහළ මිලක් නිර්මාණය කිරීමට වෙළෙන්දනට ඇති ඉඩකඩ සංගති විරෝධී ( Antitrust) නීතිය විසින් අවුරාලනු ලබයි. ඒකාධිකාරී බලයක් නිර්මාණය වීමට බලපාන්නා වූ සෙසු අය බැහැර කර තැබෙන පියවර ගැනීමේ හැකියාව ද එමඟින් වෙළෙන්දනට අහිමි කෙරෙන්නේ ය.

අතරමැදියන් පිළබඳ ගැටලුව : සහල් ඉල්ලුමෙහි තදබදය අඩු කරලීමට පියවර ගන්නා අතර ම අතරමැදියන් පිළබඳ ගැටලුව පිළිබඳව ද රජයේ අවධානය යොමු කළ හැකි ය. දේශීය හා ආනයනිත සහල් වෙළෙඳපොළවල පවත්නා තරගකාරිත්ව විරෝධී කටයුතු, වී අලෙවි මණ්ඩලය වැනි ක්‍රම ඔස්සේ රාජ්‍ය ඒකාධිකාරය ගොඩනැංවීම මඟින් හෝ මිල පාලනයන් පනවාලීම මඟින් හෝ අහෝසි කළ නො හැකි ය. අතරමැදියන් ගේ හැසිරීම් හේතු කොටගෙන නිර්මාණය වෙතැයි කියන ගැටලු විසඳීමෙහි දී ද මිල පාලනයකින් සාර්ථක ප්‍රතිඵල ලබාගත හැකි වන්නේ නැත.

- කාර්යක්ෂම තරඟකාරිත්ව ක්‍රම හඳුනාගෙන ඒවා ප්‍රවර්ධනය කරවීමට ද රජය පියවර ගත යුතු ය.

### දිගු කාලීනව :

- විකල්ප ආහාර වර්ග ප්‍රවර්ධනය කරවීම තුළින් සහල් සඳහා ඇති ප්‍රබල ඉල්ලුම අඩු කරවීම සඳහා දිරිගැන්වීම් ඇති කිරීම අවශ්‍ය වේ.
- සාමාන්‍ය තත්ත්වය ඉක්මවන මිලක් පවත්වාගෙන යාම මගින් සහල් සඳහා ඇති ප්‍රබල ඉල්ලුම අඩු කරවා විකල්ප ආහාර වර්ග පරිභෝජනය ඉහළ නැංවිය හැකි වනු ඇතැයි ද, ඒ අනුව එකී ඉහළ සහල් මිල ආහාර සුරක්ෂිතතාව විෂයෙහි දිගු කාලීනව වැඩ දායක වනු ඇතැයි ද යන්න කෙනෙකු ගේ අදහස විය හැකි ය.
- වඩාත් පරිභෝජක හිතෛෂී වූ ද පෝෂ්‍යජනක වූ ද විකල්ප ආහාර නිෂ්පාදනය කරවීමෙහි ලා පෞද්ගලික අංශය දිරිගැන්විය යුතු ය. මේ සඳහා කෘෂි සැකසුම් ක්‍රියාවලියක් අවශ්‍ය වන්නේ ය.

වෙනත් රටවල සහල් සඳහා වූ ඉල්ලුමෙහි තදබදය අඩු කිරීම : ජපානය, ඉන්දුනීසියාව, පිලිපීනය, සහ තායිලන්තය වැනි රටවල් ආහාර පරිභෝජනය විවිධාංගීකරණය ඔස්සේ සහල් පරිභෝජනය විෂයෙහි වූ තදබදය අඩු කරලීම පිණිස දැඩි සැලකිල්ලකින් යුතුව රාජ්‍ය ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමෙන් සාර්ථක ප්‍රතිඵල ලබාගෙන තිබේ. ( සිදික් 2004 ).

- තව ද, ජපානය වැනි රටවල් විසින් කරන ලද ආකාරයට සහල් පරිභෝජනය සඳහා වූ ඉල්ලුම අඩු කිරීම පිණිස ආහාර වේල ද විවිධාංගීකරණය කළ යුතුව තිබේ. සහල් පරිභෝජනය අඩු කොට විකල්ප ආහාර පරිභෝජනය වැඩි කළහොත් ඉදිරියේ දී සහල් අපනයනකයකු වීමේ හැකියාව ද ශ්‍රී ලංකාවට තිබේ.

ජපානයේ ආහාර පරිභෝජනය විවිධාංගීකරණය : ජපානයේ සහල් පරිභෝජනය තුළින් ශ්‍රී ලංකාවට බොහෝ ප්‍රයෝජනවත් කරුණු ඉගෙනගත හැකි ය. සමාජ ආර්ථික වෙනස්කම් රාශියක් සිදු කිරීමෙන් අනතුරුව ජපානයේ සහල් පරිභෝජනය සැලකිය යුතු ප්‍රමාණයකින් පහත බැස තිබේ. ආහාර පරිභෝජන රටාවෙහි තුලනාත්මක වෙනසක් සිදු කිරීමට මෙම පියවරයන් නිසා හැකි වී තිබේ. ධාන්‍ය (සහල් ද ඇතුළුව), අල සහ සෝයා පරිභෝජනය පහත බසිමින් වෙනත් ආහාර වර්ග ( එනම් මස්, බිත්තර, කිරි සහ තෙල් ) පරිභෝජනය ඉහළ ගොස් ඇත. ආහාර පරිභෝජනය විවිධාංගීකරණය තුළින් සහල් සඳහා වූ ඉල්ලුම අඩු කරවීමෙහි ලා ජපානය අතිශයින් සාර්ථක ප්‍රතිඵක ලබා ඇති අතර එයින් ආහාර සුරක්ෂිතතාව ද ඇති කරගෙන තිබේ.

ආශ්‍රිත ලේඛන :
හෙක්ටර් කොබ්බෑකඩුව කෘෂි පර්යේෂණ සහ පුහුණු ආයතනය
2005-2007 ARTI Data Bank

## References

***Hector Kobbekaduwa***

Agrarian Research and Training Institute. 2005-2008.
ARTI Data Bank. Available Online at: http://www.harti.slt.lk/.
Ellis, F. 1992. Agricultural Policies in Developing Countries, Cambridge: Cambridge University Press.

***Rafeek M.I.M. and P.A. Samaratunga. 2000***

"Trade Liberalization and its Impact on the Rice Sector of Sri Lanka"
Sri Lankan Journal of Agricultural Economics. Volume 3,Number 1:143 - 154.
Sidik, Mulyo. 2004.
"Indonesian Rice Policy in View of Trade Liberalization." FAO Rice Conference, Rome, Italy.

# ලිපි දායකත්වය

මෙම ප්‍රතිපත්ති සංක්ෂිප්තයට පදනම් වී ඇත්තේ ආචාර්ය O.G. දයාරත්න බණ්ඩා මහතා, ආචාර්ය ආනන්ද ජයවික්‍රම මහතා සහ ආචාර්ය M.B. රණතිලක මහතා ප්‍රසිද්ධ සංවාද සාකච්ඡාවට ඉදිරිපත් කොට ඇති විග්‍රහාත්මක ලිපියයි.

**ආචාර්ය O.G. දයාරත්න බණ්ඩා මහතා** පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකි. ඔහු කැනඩාවේ ඔන්ටාරියෝ (Ontario) හී වෝටර්ලූ විශ්වවිද්‍යාලයේ හා ජාත්‍යන්තර පාලන නවීකරණ මධ්‍යස්ථානයේ බාහිර පර්යේෂණ මහාචාර්යවරයෙකි. ඔහුගේ ඉගැන්වීමේ පළපුරුද්ද, සාර්ව ආර්ථික විද්‍යාව, ක්ෂුද්‍ර ආර්ථික විද්‍යාව, ජාත්‍යන්තර මූල්‍යකරණය හා ආයෝජන, සංවර්ධන මූල්‍යකරණ හා ආර්ථික විද්‍යා මූලධර්ම යන විෂය පද්ධති වලට විහිදේ. ඔහුගේ පර්යේෂණ උනන්දුව ඇත්තේ ජාත්‍යන්තර ප්‍රාග්ධන චලනය සහ ආර්ථික වර්ධනය, සංවර්ධන සාර්ව ආර්ථික විද්‍යාව, ආර්ථික වර්ධනයේ හා ඒකරාශීවීම් පිළිබඳ ප්‍රායෝගික මාතෘකා, වෙළඳාමේ විවෘතභාවය, නිදහස් වෙළඳ ගිවිසුම් හා සාර්ව ආර්ථික විද්‍යා ප්‍රායෝගික මාතෘකාවන්ය.

**ආචාර්ය ආනන්ද ජයවික්‍රම මහතා** පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකි. ඔහු 2007 දී සිංගප්පූරුවේ ජාතික විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධියක් ලබාගෙන ඇත. එම ආචාර්ය උපාධියට පදනම් වූයේ "Tax Smoothing and Fiscal Sustainability, and Fiscal Policy Simulation Experiments for Sri Lanka" යන පර්යේෂණයයි. ඔහු පර්යේෂණ උනන්දුව රාජ්‍ය මූල්‍ය, ආණ්ඩුව සහ ආර්ථික වර්ධනය, සේවාවන් හි වෙළඳාම සහ සේවා ආර්ථිකයයි යන මාතෘකාවන් ඔස්සේ විහිදේ.

**ආචාර්ය M. B. රණතිලක මහතා** පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකි. ඔහු ජපානයේ සාගා විශ්වවිද්‍යාලයේ විද්‍යාපති හා ආචාර්ය උපාධි ලබාගෙන ඇත. ඔහු උගන්වන කරුණු වලට ග්‍රාමීය සංවර්ධන සහ සංකේෂ්පණ හා අලෙවිකරණය ඇතුලත් වේ. ඔහුගේ පර්යේෂණ උනන්දුව ඇත්තේ ග්‍රාමීය සංවර්ධනය සහ කෘෂිකර්මික අලෙවිකරණය සහ දුප්පත්කම දුරලීම වේ.

# සංවාද...

ලාභා'පෙක්ෂාවෙන් තොර වූ හා අපක්ෂපාතී ආයතනයක් වන "පාත්ෆයින්ඩර්" පදනමේ දූත මෙහෙවර වන්නේ ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික සංවර්ධනය ආශ්‍රිත ප්‍රශ්න සම්බන්ධයෙන් පර්යේෂණාත්මක අධ්‍යයනයන්හි නිරත වෙමින්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, ප්‍රතිපත්ති සම්පාදකයින්, සිවිල් සමාජ කණ්ඩායම් හා පොදු ජනයා අතර එම ප්‍රශ්න පිළිබඳව සංවාද හා අධිවාචනයන් ඇති වීම සඳහා උත්ප්‍රේරක කාර්යභාරයක් ඉටු කිරීමයි. මෙම පදනමේ සංවාද වැඩසටහනේ අරමුණ වන්නේ යෝජිත හා අපේක්ෂිත ඉදිරි නීතිරීති මගින් ශ්‍රී ලංකාවේ ආර්ථිකය හා සමාජය වෙත එල්ල විය හැකි විවිධ බලපෑම් ගැන විචාරාත්මක විග්‍රහයන්ට හා වාද විවාදවලට මග පාදා දීමෙන් පාර්ලිමේන්තුව තුළ හා ඉන් පිටත ද ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාපටිපාටියේ ගුණාත්මකභාවය වැඩි දියුණු කරීමයි.

සංවාද වැඩසටහනේ දහවන පියවර වන මෙම දැනුවත් කිරීමේ සැසි වාරය මගින් "සහල් මිල පාලනය අර්ථවත් ද?" යන්න විග්‍රහයට ලක් කෙරේ. මෙම සටහනට පදනම් වූ විචාරාත්මක ලිපි www.sanvada.org වෙබ් අඩවිය තුළින් ලබා ගත හැක. මෙම ප්‍රකාශනයන්හි දැක්වෙන අදහස් හෝ මතයන් "පාත්ෆයින්ඩර්" පදනමේ අදහස් හෝ මතයන් හා සමග සම්පූර්ණයෙන්ම ගැලපෙන බවට නිගමනය කළ නොයුතු බව සළකන්න.

මෙහි සඳහන් අධිගමනයන් පිළිබඳ ඔබගේ නිර්මාණාත්මක විවේචනයන් සහ/හෝ පසුපෙෂණයන් අප වෙත සපයන මෙන් අපි කාරුණිකව ඉල්ලා සටිමු.

පාර්ලිමේන්තුවෙන් පිටත සිදු වන පොදු සාකච්ඡා හා වාද විවාද වල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා අප සමග එක්ව කටයුතු කරන ලෙස අපි ඔබ වෙත ආයාචනය කර සිටිමු එසේ කිරීම තුළින්, ආර්ථික ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියේ මෙන්ම මෙරට දේශපාලනමය, ආර්ථිකමය හා ව්‍යාපාරික ක්ෂෙත්‍රයන් තුළ ද යහපත් වෙනසක් සිදු කිරීමට අපට හැකි වනු ඇත.


**"පාත්ෆයින්ඩර්" පදනම**

| | |
|---|---|
| දුරකථන අංකය | 2596281 |
| ෆැක්ස් අංකය | 2595894 |
| ඊමේල් | info@pathfinderfoundation.org |
| වෙබ් අඩවිය | www.sanvada.org / www.pathfinderfoundation.org |



සංස්කරණ සහාය: අමීරා කරීම් මිය, ව්‍යාපෘති කළමනාකාරිණිය.